# සංකල්ප පත්‍රිකාව - (ගුරු තුලනය හා ගුරු මාරු)

## තාර්කිතය (Rational)

I. පාසල් 1120 කින් සමන්විත සබරගමුව පාසල් පද්ධතිය තුළ ගුරු සංඛ්‍යාව 26,458 කි. එහෙත් ප්‍රතිපත්තිමය ඌණතා, ගණනය කිරීමේ දුර්වලතා හා නිසි යාන්ත්‍රණයක් නොමැතිවීම, ස්ථාපිත ස්ථාවර දත්ත පද්ධතියක් භාවිතා නොවීම මෙන්ම වර්තමානයට කිසිසේත්ම නොගැළපෙන යාන්ත්‍රික ක්‍රම *(Manual Systems)* භාවිතය නිසා පද්ධතිය තුළ මතුසඳහන් ගැටලු පැන නැඟී පවතී.

- i. සමහර පාසල් වල ගුරු ඌණතා පැවතීම හා ඒ සමඟම සමහර පාසල් වල ගුරු අතිරික්ත පැවතීම
- ii. චක්‍රලේක සීමා නොසලකා ගුරුවරු පාසල් තුළ රඳවා ගැනීම
- iii. පෞද්ගලික කැමැත්ත, වාසි හා පහසුව අනුව උගන්වන විෂය නිර්වචනය කරගැනීම.
- iv. දරුවන්ට සමහර විෂයන් සඳහා දිගුකාලීනව ගුරුවරු අහිමිවී යාම
- v. ගුරු හිඟය නිසා විදුහල්පතිවරු පීඩාවට පත්වීම.
- vi. අවශ්‍ය ගුරුවරු සිටින ස්ථාන සොයාගැනීමේ අපහසුව
- vii. මාරුවීම් සමඟ ගුරු සංඛ්‍යාව තුලනය නොවීම *(හිඟ / අතිරික්ත ඇති වීම)*
- viii. ගුරු මාරු තුලනය සඳහා සියලුම දෙනාට විශාල කාලයක් ගත වීම හා නිසි ලෙස හා විධිමත්ව සිදු නොවීම.

II. ඉහත ගැටලු මත මතු සඳහන් නාස්තීන්, අධ්‍යාපන පද්ධතිය තුල බහුල ලෙස මෙන්ම දිගු කාලීනවම සිදු වෙමින් පවතී.

- I. ගුරු තුලනය විධිමත් නොවීම මත ගුරු වැටුප් සඳහා වන රාජ්‍ය ආයෝජන අපතේ යාම.
- II. දරුවන්ගේ අධ්‍යාපන අවස්ථා විශාල ලෙස ගිලිහී යාම.
- III. සම අධ්‍යාපන අවස්ථා හිමිකම උල්ලංඝණය වීම.
- IV. ගුරු මාරු නිසි ලෙස නොලැබීම මත ගුරුවරුන්ගේ විශ්වාසය බිඳ වැටීම
- V. පද්ධතියක ඵලදායිතාවයට හේතු වන විනිවිදභාවය හා විශ්වසනීයත්වය ගිලිහී පැවතීම.
- VI. අයථා ක්‍රම මඟින් ස්ථානගත වීම් සහ මාරු වීම් සිදු වීම.
- VII. විශාල ගුරු සංඛ්‍යාවක් ඌන උපයෝජනයට ලක් වී තිබීම.

ඉහත ගැටලු හා එම ගැටලු මත නිර්මාණය වී ඇති විශාල ලෙස කාලය, ශ්‍රමය, ධනය, අවස්ථා හා අයිතීන් නාස්ති වීම වළකාලීම පිණිස ක්‍රමික දත්ත පද්ධතියක් මත ගුරු තුලනය හා ගුරු මාරුවීම් සිදුකිරීමට සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව ලෙස පියවර ගත යුතුය.

# අරමුණු

I. පාසල් වලට උචිත ගුරු සංඛ්‍යාව නිශ්චිත ලෙස පවත්වාගෙන යාම හා එමඟින් රාජ්‍ය අරමුදල් නාස්ති වීම නවතා දැමීම.
II. පාසල් ගුරු තුලනය හා ගුරු මාරු හා ස්ථානගත කිරීමට අදාළව සිදුවන අක්‍රමිකතා හා බලපෑම් ඉවත් කිරීම.
III. ගුරු මාරු වීම්, ස්ථානගත කිරීම් හා තුලනය පිළිබඳ බිඳවැටී ඇති ගුරු, විදුහල්පති, මහජන විශ්වාසය තහවුරු කර ගැනීම.
IV. ගුරුවරුන්ගේ විශ්වාසය බිඳ වැටීම මත සිදුවන අනවශ්‍ය දේශපාලන, හිතවත්කම් වැනි දෑ මත සිදුවන බලපෑම ඉවත් කිරීම.
V. රාජ්‍ය චක්‍රලේඛ අනුව ක්‍රියාකිරීම හා එමඟින් ගුරු තුලනයට අදාළ විගණන විමසුම් අවම කිරීම.
VI. අධ්‍යාපන පද්ධතිය තුල දරුවාගේ ඉගෙනුම් අයිතීන්, ගුරුවරයාගේ වෘත්තිය අයිතීන්, ප්‍රජාවගේ සේවා අයිතීන් සුරැකීමට කටයුතු කිරීම.
VII. ගුරු මාරු හා තුලනය වෙනුවෙන් අනවශ්‍ය ලෙස සිදුවන ගුරු, විදුහල්පති, දෙමාපිය සංචරණ නැවැත්වීම මත සමාජ ව්‍යාකූලතා අවම කර ගැනීම.

# ක්‍රමවේදය

I. ගුරු, විදුහල්පති, පරිපාලන සේවා නිලධාරින් ගේ තොරතුරු ඇතුළත් දත්ත පද්ධතියක් නිර්මාණය කිරීම.
II. දත්ත පද්ධතිය මඟින් ගුරු අතිරික්ත, ඌණතා චක්‍රලේඛ පරිදි හඳුනාගැනීම.
III. එම අතිරික්ත හා ඌණතා පාසලට යථාවත් දැයි පරීක්ෂා කිරීම සඳහා කොට්ඨාස මට්ටමින් විදුහල්පතිවරු සමඟ සාකච්ඡා කිරීම.
IV. කලාප මට්ටමින් රැස්වී ගුරු අතිරික්ත හා ඌණතා සහ නව බඳවා ගැනීම් පිළිබඳ යාවත්කාලීන වූ නිවැරදි තොරතුරු වාර්තා කිරීම.
V. මාරුවීම්, විශ්‍රාම ගැනීම් වලදී අප්‍රමාදිව *(වහාම)* නව ගුරුවරු ස්ථානගත කිරීම.
VI. ගුරු තුලනය මාසිකව යාවත්කාලීන කරමින් නිවැරදිව පවත්වා ගැනීම.

# කාල රාමුව

I. දත්ත පද්ධතිය සැකසීම (2017)
II. දත්ත පද්ධතිය යාවත්කාලීන කිරීම (2018 / 2019 / 2020/2021)
III. පවත්නා ගුරු සංඛ්‍යාව හඳුනාගැනීම (2019)
IV. ගුරුතුලනය විදුහල්පතිවරු සමඟ සිදු කිරීම (2020)
V. චක්‍රලේඛ පරිදි උචිත ගුරු සංඛ්‍යාව සැකසීම (2020)
VI. පාසල් අනුව ගුරු තුලනය කොට්ඨාස මට්ටමින් සිදුකිරීම (2019 / 2021)
VII. කලාප අනුව ගුරුතුලනය පාසල් මට්ටමින් සිදු කිරීම (2019 / 2021)
VIII. 6/2021 ගුරු තුලනය හා අවශ්‍යතා සැකසීම (2021)
IX. වාර්ෂිකව ගුරුතුලනය පවත්වා ගැනීම *(අඛණ්ඩව)*
X. යථාවත් කිරීම (**Updating**) අඛණ්ඩව සිදු කිරීම *(අඛණ්ඩව)*

# ලබා ඇති ප්‍රගතිය

I. දත්ත පද්ධතිය නිසි ලෙස සකසා ඇත.
II. සියලුම දත්ත ඇතුළත් කර ඇත.
III. වාර්ෂික ගුරු මාරු 2020 සිට Online ක්‍රමයට ක්‍රියාත්මක කර ඇත.
IV. 1/2016 හා 6/2021 චක්‍රලේක පරිදි ගුරු තුලනය කර ඇත.
V. විශ්‍රාම යාම්, මාරුවීම් මත බඳවා ගැනීම් විෂයානුබද්ධව නිසි ලෙස පාසලේ අවශ්‍යතා අනුව සිදු කිරීමට කටයුතු කර ඇත.
VI. අතිරික්ත හඳුනාගෙන තුලනය සිදු කරන අතර, ගැටලු සඳහා විකල්ප ක්‍රියාත්මක කර ඇත.
VII. ඉදිරි වසර 5ක ගුරු අවශ්‍යතා විෂයානුබද්ධව පුරෝකථනය කල හැකිය.
VIII. විෂයකට අදාළ ඕනෑම ගුරුවරයෙකු සිටින පාසල හා විස්තර සියල්ලම පරික්ෂා කළ හැකිය.
IX. 2021 ගුරු මාරු ක්‍රියාත්මක වෙමින් පවතී.
X. 2021 ජාතික මට්ටමේ ගුරු මාරු ක්‍රියාත්මක කිරීමට දත්ත පද්ධතිය ලබා දී ඇත.